සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development

ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
ஆரம்ப கைத்தொழில் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
MINISTRY OF PRIMARY INDUSTRIES AND SOCIAL EMPOWERMENT

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No: DSD/HO/MF/BR/05 | ඔබේ අංකය / உமது இல / Your No: ............ | දිනය / திகதி / Date: 2019.10.11 |

සියළුම සමෘද්ධි බැංකු කළමණාකරුවන් හා

බැංකු සමිති කළමණාකරුවන් වෙත.

**<u>2020 වසර සඳහා සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිතිවල ලියාපදිංචිය අළුත් කිරීම.</u>**

වාර්ෂිකව සමෘද්ධි බැංකු හා බැංකු සමිති වල ලියාපදිංචිය අළුත් කිරිම සම්බන්ධව උපදෙස් ලබාදුන් ඉහත සමාංක දරණ 2018.11.28 දිනැති ලිපිය හා බැදේ.එම ලිපිය මගින් 2019 වසර සඳහා සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති වල ලියාපදිංචිය අළුත් කිරිමට අදාල උපදෙස් නිකුත් කර ඇත.

02. 2017 මාර්තු 07 දින නිකුත් කල 2009/08 අංක දරණ ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදි ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ සඳහන් නියෝග ප්‍රකාරව සමෘද්ධි බැංකු සහ සමෘද්ධි බැංකු සමිති සෑම වර්ෂයකම මාර්තු 31දිනට යටත් පිරිසෙන් දින 30 කට ප්‍රථම (නියෝග අංක 5(6) යටතේ ) ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කර ලියාපදිංචිය අළුත් කරනු ලැබිය යුතුය.

03. ඒ අනුව, ඔබ විසින් 2020 වර්ෂය සඳහා, 2020 ජනවාරි මස 31 දිනට පෙර සමෘද්ධි ප්‍රජාමූල බැංකුව/ බැංකු සමිතිය ලියාපදිංචිය අළුත් කිරිම සඳහා අයදුම්පත් යොමු කල යුතුවේ. මෙම ලියාපදිංචිය අළුත් කිරිමේ කටයුතු සමෘද්ධි බැංකු හා බැංකු සමිති වලට අදාල නියෝග ප්‍රකාරව සිදුවිය යුතු නීතිමය කටයුත්තක් බැවින්, අදාල අයදුම් පත්‍ර නිවැරදිව නියමිත දිනට යොමු කිරිමට වගබලා ගතයුතුය.

04. 2020 වර්ෂයේ සිට බැංකු /බැංකු සමිති ලියාපදිංචිය අළුත් කිරිමේ දි වෙන වෙනම ලියාපදිංචි ගාස්තු ගෙන්වා ගැනීම නොකරන අතර, සමෘද්ධි බැංකු සමිතිය විසින් තම බල ප්‍රදේශයේ සියළුම බැංකු හා බැංකු සමිතිවල ලියාපදිංචි ගාස්තුව බැංකු සමිතියට පලමුව එකතුතර ගත යුතුය. සමෘද්ධි බැංකු සමිතිය විසින් තම ජංගම ගිණුමට බැංකුවේ වාර්ෂික ලියාපදිංචිය අලුත් කිරිමේ ගාස්තුව වන රු.1000/-ක් රැස්කර ගත යුතුය. එහිදි සමෘද්ධි ප්‍රජාමූල බැංකු වලින් රැස්කරන ලද චෙක්පත උපලබ්දි වූ විටක පහත පරිදි ගිණුම් සටහන් තැබිය යුතුය.

හර - ගනුදෙණු කරුවන් තැන්පත් කල චෙක්පත් ගිණුම

බැර - සමෘද්ධි බැංකු වාර්ෂිකව ලියාපදිංචිය අළුත් කිරිමේ ගාස්තු රැස්කිරීමේ ගිණුම. (කේත අංක 9425)

05.ඉන් අනතුරුව,බැංකු වලින් ලද අයදුම්පත් හා බැංකු සමිතියේ අයදුම්පත අනෙකුත් ලියවිලි සමඟ ක්ෂුද්‍ර මූල්‍ය අංශය වෙත එවිය යුතුය. සියළුම බැංකු /බැංකු සමිතියේ වාර්ෂික ලියාපදිංචි ගාස්තුව සඳහා චෙක්පත **<u>"කළමණාකරු ,ලංකා බැංකුව බත්තරමුල්ල සමෘද්ධි ප්‍රජාමූල බැංකු අංශයේ ආයෝජන ගිණුම" ජංගම ගිණුම අංක 3417925ට බැර වන සේ</u>** ලියා එවිය යුතුය. එහිදි පහත ගිණුම සටහන් තැබීමට කටයුතු කල යුතුය.(චෙක්පත ලිවීමේදි දින 60කට වලංගු වන සේ චෙක්පත ලිවිය යුතුය)

හර - සමෘද්ධි බැංකු වාර්ෂිකව ලියාපදිංචිය අළුත් කිරිමේ ගාස්තු රැස්කිරීමේ ගිණුම (බැංකු වලින් ලැබුණු මුදල)

හර - වැය ගිණුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති ලියාපදිංචි ගාස්තු ගිණුම (බැංකු සමිති වාර්ෂික ගාස්තුව රු.1000ක මුදල)

බැර - ජංගම ගිණුම

1 Bank Reg Renewal 2020 Circular.doc

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. 1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අධ්‍යක්ෂ (පාලන හා ආයතන) / பணிப்பாளர் (நிர்வாகம்/தாபனம்) / Director (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරි / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | Hot Line:0112-885582 | Hot Line: 011- 2887722 |
| | | Hot Line :0112-889007 | | | |

06. මෙම ආකාරයට එක් චෙක්පතකින් සමෘද්ධි බැංකු සමිති මට්ටමින් ලියාපදිංචි ගාස්තු ගෙන්වා ගැනීමේ අරමුණ වනුයේ පරිපාලන කටයුතු පහසු වීම සඳහා වන අතර කඩින් කඩ චෙක්පත් යොමු නොකර සමෘද්ධි ප්‍රජා මූල බැංකු හා බැංකු සමිති වල ලියාපදිංචිය අළුත් කිරිමේ අයදුම් පත්‍ර හා ලියාපදිංචි ගාස්තු නියමිත දිනට නිවැරදිව යොමු කිරිම සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති කළමණාකරුගේ වගකීම වනු ඇත.මෙම උපදෙස් සමඟ අමුණා ඇති ආවරණ ලිපියේ ආකෘතිය අනුව ලියාපදිංචියට අදාලව චෙක්පත හා අයදුම් පත්‍ර යොමු කල යුතුය.

07.ලියාපදිංචිය අළුත් කිරිමේ අයදුම් පත්‍රය, ප්‍රජාමූල සංවිධාන තොරතුරු, මහ සභා සහ පාලක මණ්ඩල තොරතුරු,මූල්‍ය තත්ව විස්තර,ආදායම් ප්‍රකාශ තොරතුරු ආකෘති පත්‍ර දැනටමත්,සමෘද්ධි වෙබ් අඩවියේ ඇතුලත් කර ඇත.ප්‍රජා මූල සංවිධාන තොරතුරු ඉදිරිපත් කිරිමේදි නැවත සියළුම ප්‍රජා සංවිධාන තොරතුරු යොමු කිරිම අත්‍යාවශ්‍ය නොවන අතර සංශෝධිත තොරතුරු පමණක් යොමු කිරිම ප්‍රමාණවත්වේ.


08.සමෘද්ධි බැංකු හා බැංකු සමිතියට පාලක මණ්ඩලය / විධායක කමිටුව පත්කිරිමේ උපදෙස් අංක ස/ප්‍ර/බැ/2017/06 හා 2017.3.17 දිනැති චක්‍ර ලේඛයේ උපදෙස් පරිදි,වන අතර **<u>වයස අවුරුදු 70 ඉක්මවූවන් හා අඛණ්ඩව වසර දෙකකට වඩා පාලක මණ්ඩලයේ හෝ විධායක කමිටුවේ සභාපති තනතුර දරණ අය පත්කිරිම නොකල යුතුය.</u>**

09.2019.12.31 දිනට පෙර අදාල මහසභා රැස්වීම් පවත්වා, නව පාලක මණ්ඩලයේ / විධායක කමිටුවේ සභාපතිගේ අත්සනින් යුතුව 2020 ජනවාරි මස 31 දිනට පෙර අයදුම් පත්‍ර හා චෙක්පත යොමුකල යුතුය.

10.සමෘද්ධි බැංකු / සමෘද්ධි බැංකු සමිති වාර්ෂික මහ සභා රැස්වීම් පැවැත්වීමේදි සංග්‍රහ වියදම් සඳහා අරමුදල් ලබාගැනීමේදි උපදෙස් අංක DSD/HO/MF/SBU/05 හා 2018.01.18 ලිපිය සඳහන් උපදෙස් නොවෙනස්ව පවති. ඒ අනුව එක් අයෙකුට උපරිම රු.300/-කට යටත්ව සංග්‍රහ වියදම් සඳහා මුදල් වැය කල හැක.

11.නියමිත දිනට අයදුම් පත්‍ර යොමු නොකරන සමෘද්ධි බැංකු හෝ බැංකු සමිති, වලින් **<u>ලියාපදිංචි ගාස්තුවෙන් 50%ක දඩ මුදලක් අය කරන බවද දන්වමි.</u>** සමෘද්ධි බැංකු සහ බැංකු සමිති වලට අදාල නියෝග ප්‍රකාරව සමෘද්ධි බැංකු හා බැංකු සමිති වල ලියාපදිංචිය නියමිත දිනට අළුත් කිරිමේ කටයුතු වල **වගකීම සමෘද්ධි බැංකු සමිති කළමණාකරු වෙත පැවරේ.**

12.ඉහත උපදෙස් අනුගමනය කරමින්,සමෘද්ධි බැංකු සහ බැංකු සමිති වල 2020 වසරට අදාල ලියාපදිංචිය අළුත් කිරිමේ අයදුම් පත්‍ර යොමු කරන ලෙස කාරුණිකව දන්වමි. මෙම ලියාපදිංචි කටයුතු පිළිබඳව යම් පැහැදිලි කර ගැනීමක් අවශ්‍යවේ නම් දුරකථන අංක 011 - 2 887469 අමතන ලෙසද වැඩිදුරටත් සඳහන් කරමි.



එස්.ඊ.ආර්.ටී.එම්.එස්.පී.බණ්ඩාර

අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් -

1. ලේකම්, ප්‍රාථමික කර්මාන්ත හා සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය - කා.දැ.ස
2. සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්/දිස්ත්‍රික් ලේකම් - කා.දැ.ස
3. සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ - දැ.ගැ.පි සහ අ.ක.ස
4. සියළුම ප්‍රාදේශිය ලේකම්වරුන් - දැ.ගැ.පි
5. සියළුම අධ්‍යක්ෂවරුන්(සමෘද්ධි සං. දෙ. ) - දැ.ගැ.පි
6. ප්‍රධාන ගණකාධිකාරි - දැ.ගැ.පි
7. ප්‍රධාන අභ්‍යන්තර විගණක - දැ.ගැ.පි